# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1868/62 - 2014 ජුනි මස 27 වැනි සිකුරාදා - 2014.06.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

දකුණු පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අතුල වෙළඳගොඩ හේවගේ නම් වූ සභිකයා අයත් වන ජනතා විමුක්ති පෙරමුණ නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී, ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන වඳුරඹ මුදියන්සෙලාගේ සාන්ත මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී උඩහ දාසිලිගේ දීපාල් දර්ශන චන්ද්‍රරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, වඳුරඹ මුදියන්සෙලාගේ සාන්ත මහතා අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

යූ. ඩී. ඩී. ඩී. චන්ද්‍රරත්න,
තේරීම් භාර නිලධාරී,
අම්බලන්තොට ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 26 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

07 - 362


1A - G 19795— 45 (2014/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වැනි අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ**
**සූරියවැව ප්‍රාදේශීය සභාවේ**
**සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

දකුණු පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන සූරියවැව ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ, සභාපති වන පේදුරු ආරච්චිගේ සුජිත් මුතුකුමාරණ නම් වූ සභාපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, සූරියවැව ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජාතුංගේ එරන්ද ජනක මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

සූරියවැව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී උඩහ දාසිලිගේ දීපාල් දර්ශන චන්ද්‍රරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ජාතුංගේ එරන්ද ජනක මහතා සූරියවැව ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

යූ. ඩී. ඩී. ඩී. චන්ද්‍රරත්න,
තේරීම් භාර නිලධාරී,
සූරියවැව ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 26 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
හම්බන්තොට.

07 - 363

---

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ**
**සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

බස්නාහිර පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොට ගෙන මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඇඩ්වඩ් ගුණසේකර නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්, ඒ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන එරන්ද ඉන්දික සුබසිංහ මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී පතිරාජ ආරච්චිල්ලාගේ සුනිල් සේනාරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, එරන්ද ඉන්දික සුබසිංහ මහතා මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම් භාර නිලධාරී,
මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 26 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

07 - 364

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.